# දැනුමට ප්‍රවේශයක්.......

## ***S**hall share **o**ur **K**nowledge*

- දැනුමින් පිරිපුන් වඩා යහපත් සමාජයක් කරා පියමන් තැබීමේ මූලික පියවරක් වශයෙන් අප ආයතනය විසින් අළුතින් ආරම්භ කිරීමට නියමිත "Maxies Academy" ය නිර්මාණය කිරීමට මූලික අඩිතාලම දමමින් පවතින බව දැන් අප කාටත් නොරහසකි. කුසලතාවයන් හා හැකියාවන් ඇති පුද්ගලයින් සමූහයක් අප ආයතනය තුළ විසිර සිටින අතර, ඔවුන්ව ඒකරාශි කරගනිමින් තමන්ගේ දැනුම අන් අය සමග බෙදා ගැනීම, දැනුම වර්ධනය (අධ්‍යාපනික අංශය) කර ගැනීම සඳහා රුකුලක් වනු ඇත. මෙය "Maxies Academy" යේ පරමාර්ථයක්ද වනු නොඅනුමානය. තොරතුරු තාක්ෂණ අංශයේ අප සියළු දෙනා, අප සතු දැනුම අනෙක් අය සමග බෙද ගැනීමට Maxie's Udanaya හරහා යම් ප්‍රවේශයක් ගන්නට තීරණය කරමු. එහි ප්‍රතිඵලයක් ලෙස මෙතැන් පටන් ඉදිරි කලාප වලදී එදිනෙද භාවිතයට අදල පරිගණක දැනුම ලිපි මගින් ඔබවෙත ඉදිරිපත් කරන්නෙමු.

- තොරතුරු තාක්ෂණය අද ලොව පුරාම ඉතාමත් සීඝ්‍රයෙන් වර්ධනය වන අතර, අප ආයතනයේද එදිනෙද බොහෝ කාර්යයන් සඳහා තොරතුරු තාක්ෂණය ප්‍රයෝජනයට ගනු ලබයි. තම වැඩකටයුතු කාර්යක්ෂමව හා ඵලදයි ලෙස කර ගැනීමට, අප ආයතනයේ සාමාජිකයන්ගේද තොරතුරු තාක්ෂණ නිපුණතාවය වර්ධනය කර ගැනිම සිදු කළ යුතුම කාර්යයකි. අප මුලින්ම සෑම පරිගණකයකම එදිනෙද භාවිතයට ගනු ලබන Microsoft Office පැකේජය වෙනුවට, ඒ හා සමානව කාර්යාල කටයුතු කිරීමට හැකියාව ඇති, දැනට අප ආයතනය තුළද භාවිතා වන Openoffice පැකේජය පිළිබඳ කථා කිරීමට බලාපොරොත්තු වෙමු.

- Microsoft Office පැකේජය අදල බලපත්‍ර ලබාගෙන භාවිතා කළ යුතු පැකේජයකි. නමුත් බොහෝ අවස්ථාවලදී සිදුවන්නේ බලපත්‍ර ලබා නොගෙන නීත්‍යානුකූල නොවන අයුරින් මෙම මෘදුකාංගය භාවිතා කිරීමයි. බුද්ධිමය දේපල පනතේ විධි විධාන අනුව මෙය නීති විරෝධි ක්‍රියාවක් ලෙස Microsoft ආයතනය පෙන්වා දෙයි. අතීතයේදි මෙන් නොව වර්තමානයේදි, ඒ සඳහා නීතිමය පියවර ගැනීමට අදල මෘදුකාංග නිෂ්පාදන ආයතන අප රට තුලදීද සංවිධානය වී ඇති බවක් දක්නට ඇත. එසේම ඔවුන් එසේ නීතිමය පියවර ගත් අවස්ථාද දක්නට ලැබිණ. එනම් මෙහිදී අප සියළුම දෙනා දැනුවත්ව හෝ නොදැනුවත්ව අවදානමකට ලක්ව ඇති බව නොරහසකි. පූර්ණ ලියාපදිංචි තත්ත්ව යටතේ Openoffice පැකේජය භාවිතා කිරීමෙන් මෙම අවදානම මග හරවා ගැනීමට අපට පුළුවන.

- Microsoft Office Home and Business 2010 පැකේජයේ මිල $280(Word, Excel, PowerPoint, Outlook, One Note) හා Microsoft Office Professional පැකේජය $500 (Word, Excel, PowerPoint, Outlook, OneNote, Access, Publisher) පමණ වේ. උදහරණයක් වශයෙන් ආයතනයක් තුළ භාවිතා වන එක් පරිගණකයක MS Office සඳහා පමණක් රු. 30,000/= ($280) පමණ මුදලක් අවම ලෙස වැය කිරීමට සිදුවේ. පරිගණක 150 ක් පමණ භාවිතා වන අප වැනි ආයතනයකට Microsoft Office පැකේජය සඳහා පමණක් රුපියල් මිලියන 4.6 ($280*150*110) පමණ වැය කිරීමට සිදුවනු ඇත.

- එසේ වුවද මෙම මෘදුකාංග එහි නිෂ්පාදකයින් විසින් නව පහසුකම් හා විශේෂාංග ඇතුලත් කරන ලද ඊළග සංස්කරණය වෙළඳපොළට ඉදිරිපත් කරනු ලබයි. එහිදීද එම නිෂ්පාදනයන්ට අදළ නියමිත මුළු මුදලම වැය කර, එය නැවත මිලදී ගැනිමට පාරිභෝගිකයාට සිදුවේ. Microsoft Office පැකේජය භාවිතා කිරීමේදි පාරිභෝගිකයා මුහුණපාන මූලික ගැටළුවක් ලෙස මෙය දැක්වීමට පුළුවන.

- බොහෝ විට කාර්යාල වැඩකටයුතු වලදී වැඩි වශයෙන් භාවිතා වනුයේ Microsoft word සහ Microsoft Excel වේ. නමුත් Microsoft Office පැකේජය මිලදී ගැනීමේදි අනෙකුත් අත්‍යාවශ්‍ය නොවන්නා වු application සඳහාද මුදල් ගෙවීමටද සිදු වේ. වෙන වෙනම application (Ex: MS Excel පමණක් හෝ MS Word පමණක්) මිලදී ගැනීමේ හැකියාව ඇතත් ඒ සඳහා මුදල් වැය කිරීම නිෂ්ඵල කාර්යයක් වන්නේ එක් application එකක් සඳහා පමණක් මිල රු. 15,000/= ($129 )

පමණ ගෙවීමට සිදුවන නිසාය. මේ වන විට ශ්‍රී ලංකාව තුළද Microsoft Office භාවිතාව අතිමහත්ය. එනම් නීත්‍යානුකූල ලෙස Microsoft Office පැකේජය ලබා ගැනීමේදී විදේශිය රටවලට ඇදී යන ඩොලර් ප්‍රමාණය ඉතා අධිකය. මෙය දියුණු වෙමින් පවතින රටක ආර්ථිකයට සුබදායි තත්ත්වයක් නොවනු ඇත.

- Microsoft Office පැකේජය ආකර්ෂණීයත්වය අතින් ඉහළ මට්ටමක පවතින නිසා පාරිභෝගිකයන්ගේ කැමැත්ත Microsoft Office පැකේජය සඳහා වැඩිය. නමුත් කාර්යක්ෂමතාවය අතින් Openoffice ඉදිරියෙන් සිටින අතර Openoffice තුළ MS Office තුළ නොමැති අමතර අංග ද දක්නට ලැබේ.

- MS Office පැකේජය නිර්මාණය වී ඇත්තේ MS Windows, Mac යන මෙහෙයුම් පද්ධති වල ක්‍රියා කල හැකි ලෙස පමණි. නමුත් Openoffice, Windows, Linux, Mac වැනි මෙහෙයුම් පද්ධති කිහිපයක ක්‍රියා කළ හැකි පැකේජයක් ලෙස නිර්මාණය කර ඇත.

- " Microsoft Office පැකේජය මෙතරම් මුදලකට අලෙවි කරද්දී එවැනිම පහසුකම් සහිත වූ Openoffice පැකේජය **නොමිලේ** ලබා දෙන්නේ ඇයි ?" යන්න නිසැකවම අප තුලින් නැගෙන ප්‍රශ්නයකි. එයට හේතුව මෙවැනි නිෂ්පාදනයක් සඳහා විශාල මුදලක් හා දැනුමක් භාවිතා කිරීමට සිදුවන නිසාය. එය එසේ වන්නේ මෙය නිසි ලෙස සංවිධානය වු, ලොව වටා සිටින යම් යම් හැකියාවන් වලින් පරිපූර්ණ වු පුද්ගලයින් සමූහයක් විසින් තමන්ගේ දැනුම, ශ්‍රමය හා මුදල් නොමිලේ ලබා දීමෙන් ගොඩනගා ගෙන පවත්වා ගෙන යනු ලබන සංවිධානයක් මඟින් Openoffice එළි දක්වන නිෂ්පාදනයක් නිසාය.

- Microsoft Office සහ Openoffice application සසඳා බලමු.

| **Microsoft Office** | **Openoffice** |
|---|---|
| Microsoft Word | Openoffice Writer |
| Microsoft Excel | Openoffice Calc |
| Microsoft PowerPoint | Openoffice Impress |
| Microsoft Access | Openoffice Base |

- Openoffice හි අඩංගු මෘදුකාංග පිළිබඳව, ඉදිරි ලිපි වලින් සාකච්ඡා කිරීමට තොරතුරු තාක්ෂණ කණ්ඩායම (IT Team) බලාපොරොත්තු වන අතර, මේ පිළිබඳ ඔබට ඇති ගැටළු හා යෝජනා තොරතුරු තාක්ෂණ අංශය වෙත යොමු කිරීමෙන් ඒ සඳහා පිළිතුරු ලබා දීමටද අප අංශය බලාපොරොත්තු වේ.

ඉදිරිපත් කිරීම : ***Maxies IT Team***